පාර්ලිමේන්තුවේ පුස්තකාලය
කො. ළ. ඹ.

# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 11 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 පෙබරවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 පෙබරවාරි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 35 යි    තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1980 අංක 11 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1980 පෙබරවාරි මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 3/80.

**1980 ජනවාරි මස 19 වන දින සිට ක්‍රියාත්මක වීම අවසන් වූ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 12 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක වීමේ කාලය දීර්ඝ කිරීම සඳහා සහ එකී අවසන්වීම නිසා අවශ්‍ය වන වලංගු කිරීම් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 11 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 12 දරන පනත ක්‍රියාත්මක වීම දිගට ම බල පැවැත්වීම.

2. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 12 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තියේ විධිවිධාන නොතකා, ඒ පනත 1978 ජූලි මස 20 වන දින සිට ආරම්භ වන මාස විසිහතරක කාලයක් ක්‍රියාත්මක වන බව සහ ක්‍රියාත්මකව පැවති බව සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 12 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුකොටගෙන ඒ පනත ක්‍රියාත්මක වීම අවසන්වීම නොතකා, 1980 ජනවාරි මස 10 වන දිනෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය දක්වා වූ කාලය තුළ දී—

(අ) ලියාපදිංචි කරන ලද සමිතියක කටයුතු කළමනාකරණය කිරීමට සහ පරිපාලනය කිරීමට එකී පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ හෝ 2 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ හෝ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් මඟින් පත් කරන ලද සෑම තැනැත්තකු ම වලංගු ලෙස ඒ ධුරයේ දිගට ම ක්‍රියා කර ඇති ලෙස සැලකිය යුතු ය;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් තැනැත්තකු විසින් ඒ පනතේ 2 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි (අ) ඡේදයේ හා (ආ) ඡේදයේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ යම් බලතල, අයිතිවාසිකම් හෝ වරප්‍රසාද වලංගු ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය;

(ඇ) (අ) ඡේදයෙහි සඳහන් තැනැත්තකු විසින් ඒ පනතේ 2 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ යම් වගකීමකට යටත්ව ඇති අවස්ථාවක, ඒ වගකීම දිගට ම පැවති ලෙස සැලකිය යුතු ය;

2 — ඒ 47340 — 10,900 (80/03)

(ආ) (අ) ඡේදයෙහි සඳහන් තැනැත්තකුට ඒ පනතේ 2 වන වගන්තියේ (8) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ගෙවන ලද යම් දීමනාවක් වලංගු ලෙස ගෙවූ දීමනාවක් ලෙස සැලකිය යුතු ය ; තව ද

(ඉ) (අ) ඡේදයෙහි සඳහන් තැනැත්තකු විසින් ඒ පනතේ විධිවිධාන යටතේ ඉටු කරන ලද සියලු ක්‍රියා වලංගු ලෙස කළ ක්‍රියා ලෙස සැලකිය යුතු ය.